**ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය - 2020**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ("අධිකාරිය") 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත **(SLPSAS) 7- දේපළ පිරියත හා උපකරණ** 65 වැනි ඡේදය අනුව සම්පූර්ණයෙන් ක්ෂය වූ වත්කම්වල ප්‍රයෝජනවත් ආර්ථික ආයු කාලය නැවත ඇගයීම් කිරීමකින් තොරව රුපියල් මිලියන 79.82 ක දේපළ,පිරියත හා උපකරණ අධිකාරිය විසින් අඛණ්ඩව භාවිත කරනු ලබයි.<br>තවද, **SLPSAS 3- ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වල වෙනස්වීම් සහ දෝෂ** වලට අනුව සම්පූර්ණ ක්ෂය වූ වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලයෙහි ඇස්තමේන්තු දෝෂය නිවැරදි කර අදාළ ගැලපීම් මූල්‍ය ප්‍රකාශන වල සිදු කර නොතිබුණි. | අභ්‍යන්තර කමිටුවක් පත් කර සම්පූර්ණයෙන්ම ක්ෂය වූ ස්ථාවර වත්කම් නැවත ඇගයීම් කිරීමට පියවර ගෙන ඇත. නැවත ඇගයීම් කිරීමේ ක්‍රියාවලිය ඉහත කී කමිටුව මගින් සිදු කරනු ලැබේ. නැවත ඇගයීම් කිරීමේ ක්‍රියාවලිය කමිටුව මගින් සම්පූර්ණ කළ වහාම මූල්‍ය ප්‍රකාශන වල ගැලපීම් සිදු කරනු ලැබේ. | සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම්වල ප්‍රයෝජනවත් ආර්ථික ආයු කාලය තවදුරටත් ප්‍රමාදයකින් තොරව නැවත ඇගයීම් කිරීමට ක්‍රියා කළ යුතු අතර නැවත ඇගයීම් කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමෙන් පසු අදාළ හෙළිදරව් කිරීම් සහ ගිණුම්කරණ ප්‍රතිපාදනයන් සිදු කළ යුතුය. |
| (ආ) 2020 ජනවාරි 01 දිනට පිරිවැය සහ ශුද්ධ අගය පිළිවෙලින් රු. 19,512,500 ක් සහ රු. 7,317,187 ක් වූ යන්ත්‍රෝපකරණ සහ උපකරණ අයිතම | අදාළ හෙළිදරව් කිරීම් හිමිකම් වෙනස්වීම් ප්‍රකාශයේ සංසන්දනාත්මක සංඛ්‍යාවලින් 2021 අවසාන | ගිණුම්කරණ ප්‍රමිතිවල විධිවිධාන අනුව අවශ්‍ය ගිණුම්කරණ ප්‍රතිපාදනයන් සිදු කළ යුතුය. |

දහතුනක් 2019 වර්ෂය සඳහා සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණයේ දී භාවිතයට නුසුදුසු බවට හඳුනා ගන්නා ලදී. ඉන්පසුව, 2021 ඔක්තොම්බර් 31 දින වන විට ද මෙම අයිතම බැහැර කිරීමට පියවර ගැනීමකින් තොරව ක්ෂය කළ හැකි වටිනාකම රු. 7,317,187 ක් 2020 වර්ෂයේ දී ගිණුම් ඇස්තමේන්තු වල වෙනසක් ලෙස රඳවා ගත් ලාභයට ගළපා තිබුණි. තවද **ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අංක 03- ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වල වෙනස්කම් සහ දෝෂ** 44 වගන්තිය ප්‍රකාරව අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදු කර නොතිබුණි. ගිණුම්වල පෙන්වනු ඇත.

## 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩමක ක්‍රියාත්මක වන අධිකාරියේ, ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානය (CETRAC) සඳහා හිමිකම් ඔප්පුව ලබා දීමට අදාළ රු. 54,890,701 ක මුළු මුදල පියවන ලෙස නාගරික සංවර්ධන අධිකාරිය (UDA) 2019 වර්ෂය තුළදී ඉල්ලීමක් සිදු කර ඇත. කෙසේ වෙතත්, මෙම වාර්තාව නිකුත් කරන දිනය දක්වා මෙම මුදල නාගරික සංවර්ධන අධිකාරිය වෙත පියවීමට අධිකාරිය අපොහොසත් වී ඇති අතර මේ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන වල ප්‍රතිපාදන හෝ හෙළිදරව් කිරීමක් සිදු කර නොතිබුණි. | නාගරික සංවර්ධන අධිකාරියට අයත් CETRAC ඉඩම සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීමට හෝ සුදුසු ප්‍රතිපාදන කිරීමට පියවර ගනු ලැබේ. | මෙම ගැටළුව විසඳීම සඳහා අධිකාරිය UDA සමඟ විධිමත් බඳු ගිවිසුමකට එළඹිය යුතු අතර අදාළ හෙළිදරව් කිරීම්, ගැලපීම් අවසාන ගිණුම්වල සිදු කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂය තුළ ඉදිකිරීම් විශිෂ්ටතා සම්මාන උළෙල නොපැවැත්වුවද, 2020 වර්ෂයේදී මෙම උත්සවය පැවැත්වීම සඳහා කොන්ත්‍රාත්කරුවන්ගෙන් ලැබුණු රු. 2,633,914 ක මුදල මූල්‍ය ප්‍රකාශනවල ජංගම වගකීමක් ලෙස නොසලකමින් මූල්‍ය ප්‍රකාශනවල ක්‍රියාකාරී නොවන ආදායමක් ලෙස හඳුනාගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාලෝචිත වර්ෂය සඳහා වූ අතිරික්තය අධිතක්සේරු වී තිබූ අතර ජංගම වගකීම් සමාන වටිනාකමකින් අඩුවෙන් දක්වා තිබුණි. | රු.2,633,914.00 ක් 2020 වසරේ ඉදිකිරීම් විශිෂ්ටතා ආදායම සඳහා ලැබී ඇත. එය 2020 අවසන් ගිණුම්වල මෙහෙයුම් නොවන ආදායමක් ලෙස සටහන් කර ඇත. අපි ලබන වසරේ දී මෙය නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන්නෙමු. | 2021 වර්ෂය සඳහා අවසාන ගිණුම් සකස් කිරීමේදී අවශ්‍ය ගැලපීම් සිදු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) අධ්‍යාපන අමාත්‍යාංශය විසින් වසර 13ක සහතික කළ අඛණ්ඩ අධ්‍යාපන පුහුණු වැඩසටහනක් (NVQ) පැවැත්වීම සඳහා අධිකාරියට රු. 45,844,000 ක මුදලක් 2020 වර්ෂය තුළ වෙන් කර ඇත. එයින් රු. 10,000,000 සහ රු. 35,844,000 ක මුදලක් සමාලෝචිත වර්ෂය සහ 2021 වර්ෂය තුළ පිළිවෙලින් ලැබී ඇත. එසේ වුවද, අධිකාරිය විසින් 2020 වර්ෂය සඳහා රු. 45,398,000 ක් ආදායම ලෙස හඳුනා ගත්ත ද , වාර්තා කරන කාලය තුළ මෙම පුහුණු වැඩසටහන සඳහා වැය කර ඇත්තේ රු. 5,906,904 ක් පමණි.<br>තවද, දරන ලද වියදම් සහ එහි අතිරික්තයන් මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම අනාවරණය කර නොතිබුණි. | අධිකාරිය විසින් ගනුදෙනු වාර්තා කිරීම සඳහා උපචිත පදනම යොදා ගනී. අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අධිකාරියට රු. 45,844,000.00 ක් වසර 13 ක සහතික කළ අඛණ්ඩ අධ්‍යාපන (NVQ) පුහුණු වැඩසටහනක් පැවැත්වීම සඳහා 2020 වර්ෂය තුළ දී වෙන් කර ඇති අතර එය 2020 වර්ෂය සඳහා ආදයමක් ලෙස හඳුනා ගෙන ඇත.එයින් රු. 10,000,000.00 ක් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලැබී ඇත. අධිකාරිය ඉතිරි මුදල් ලබා ගැනීම සඳහා 2020 සිට ලෙස ඉල්ලීම් කර ඇත. | අධිකාරිය විසින් නිසි ආදායම් හඳුනාගැනීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කළ යුතු අතර මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණවත් ලෙස හෙළිදරව් කළ යුතුය. |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (i) කෙටිකාලීන ප්‍රතිපාදන | 156,400 | ශේෂ තහවුරු කිරීමේ ලිපි | අදහස් දැක්වීමක් නැත. | මෙම ශේෂවල නිරවද්‍යතාවය සහ විශ්වසනීයත්වය තහවුරු කිරීම සඳහා කළමනාකරණය විසින් විගණනය සඳහා අවශ්‍ය සාක්ෂි සැපයිය යුතුය. |
| (ii) කලින් ලද ආදයම් | 4,138,385 | විස්තරාතමක උපලේඛන | | |
| (iii) ප්‍රකාශන ආදායම | 5,279,206 | විස්තරාතමක උපලේඛන | | |
| (iv) කාරක ප්‍රාග්ධන වෙනස් වීම | 13,035,265 | විස්තරාතමක උපලේඛන | | |
| (v)කුලී ආදායම | 5,829,303 | තක්සේරු වාර්තා | | |
| (vi) සංචාරක බංගලාව දහයියාගම සහ කතරගම | - | NHDA සමඟ බදු ගිවිසුම් | | |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු. 14,173,303 ක් වූ මුළු ණයගැති ශේෂයෙන් රු. 1,794,089ක වටිනාකමට ණය ගැතියන් 06 දෙනකුගෙන් පමණක් තහවුරු කිරීම් ලැබී ඇති අතර අනෙකුත් ණය ගැතියන් 2021 ඔක්තෝම්බර් 31 දින වන විටත් තම හිඟ ශේෂයන් තහවුරු කර නොතිබුණි.<br>තවද, විගණනයට සපයන ලද වයස් විශ්ලේෂණවලට අනුව, රු. 5,115,648 ක ණයගැති ශේෂයන් 2020 දෙසැම්බර් 31 දිනට වසර තුනකට වැඩි කාලයක් ආපසු අයකර නොගෙන හිඟව පවතින අතර 2021 ඔක්තෝම්බර් 31 වන විට ද මෙම මුදල අයකරගෙන නොතිබුණි. | අධිකාරිය විසින් 2020.12.31 දිනට නොගෙවූ සියලුම ණය ගැතියන් වෙත තහවුරු කිරීමේ ලිපි යවා ඇත. වසර 03 කට වැඩි කාලයක් පැවති හිඟ ණයගැති ශේෂය අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | අධිකාරිය ණයගැති ශේෂය අයකර ගැනීමට ක්‍රියාමාර්ගයක් ගත යුතු අතර ණයගැතියාගේ සාධාරණ වටිනාකම අවසන් ගිණුම්වල හෙළිදරව් කළ යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනට රු. 4,135,111ක් වූ වෙළෙඳ ණය හිමියන් සහ විවිධ ණය හිමියන් වසර 05කට වැඩි කාලයක් මුළුල්ලේ නොපියවී තිබෙන බවත්, මෙම ශේෂය 2021 ඔක්තෝබර් 31 දිනට පියවීමකින් තොරව නොවෙනස්ව පැවති බවත් අනාවරණය විය. | දිගුකාලීන ණයහිමි ශේෂ පියවීමට පියවර ගනු ලැබේ. | හැකි සියලුම ණයහිමියන් කිසිදු ප්‍රමාදයකින් තොරව පියවීමට ක්‍රියා කළ යුතු අතර අනෙකුත් දෑ අවසාන ගිණුම්වලට ආදායම ලෙස සැලකිය යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

---

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්ති සහ 2018 නොවැම්බර් 14 දිනැති අංක 02/2018 දරන පොදු ව්‍යවසාය චක්‍රලේඛය. | මහා භාණ්ඩාගාරයේ අනුමැතිය සහ මුදල් අමාත්‍යවරයාගේ අනුදැනුම නොමැතිව රු. 153,231,432 ක මුදලක් කෙටිකාලීන ආයෝජන මූලාශ්‍ර වන ඇමතුම් තැන්පතු, භාණ්ඩාගාර බිල්පත් සහ ස්ථාවර තැන්පතු ආදියෙහි ආයෝජනය කර ඇත. ඉහත ආයෝජනවලින් රු. 140,707,803 ක මුදලක් වසර 04කට වැඩි කාලයක් නොවෙනස්ව පැවතුණි. | එය CIDA සේවකයින් සඳහා පාරිතෝෂිත දීමනා සඳහා වෙන් කර තබා ඇත. | අතිරික්ත මුදල් ආයෝජනය කිරීමට පෙර අවශ්‍ය අනුමැතීන් ලබා ගත යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රජයේ මූල්‍ය රෙගුලාසි | | | |
| (i) මූල්‍ය රෙගුලාසි 571 (2) | වසර 2කට වඩා වැඩි කාලයක සිට පවතින සියලුම තැන්පතු අධිකාරියේ ආදායමට බැර කළ යුතු වුවද, එසේ නොකර, ගෙවිය යුතු රඳවා තබා ගැනීම් සහ ටෙන්ඩර් තැන්පතු ආදී හඳුනා නොගත් සහ කල් ඉකුත් වූ තැන්පතු පිළිවෙලින් රු. 1,787,782 ක් සහ රු. 159,500 ක් 2020 දෙසැම්බර් 31 දිනට අධිකාරිය විසින් තැන්පතුවල තබා තිබුණි. | අදාළ ජංගම වගකීම් ශේෂ නිරවුල් කිරීමට පියවර ගනු ඇත. | වසරක කාලසීමාවක් තුළ ජංගම වගකීම් සියල්ල නිරවුල් කිරීමට ඵලදායී ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ii) අධිකාරිය විසින් නිකුත් කරන ලද 2015 ජූලි 14 දිනැති රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 3/2015 සහ 2020 අගෝස්තු 19 දිනැති අභ්‍යන්තර | - අත්තිකාරම් ප්‍රදානය කරන ලද කාර්යය අවසන් වූ වහාම හෝ මූල්‍ය වර්ෂය අවසන් වූ වහාම එම අත්තිකාරම් පියවිය යුතු වුවද, අවස්ථා 13කදී විවිධ අරමුණු සඳහා ලබා දී ඇති අත්තිකාරම් රු. 683,700 ක් දින 30 සිට 170 දක්වා කාලසීමාවක් ප්‍රමාද කිරීමෙන් පසු පියවා ඇත. | අධිකාරිය විසින් නිකුත් කරන ලද 2015 ජූලි 14 දිනැති රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 3/2015 සහ 2020 අගෝස්තු 19 දිනැති අංක 2/2020 දරන අභ්‍යන්තර චක්‍රලේඛය මගින් සංශෝධිත මූල්‍ය රෙගුලාසි 371 ට | අභ්‍යන්තර හා බාහිර චක්‍රලේඛවල ඇති විධිවිධානවලට අනුකූලව ක්‍රියාත්මක කිරීමට වහාම පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| චක්‍රලේඛ අංක 2/2020 මගින් සංශෝධිත මූල්‍ය රෙගුලාසි 371. | - එක් එක් වාර්තාකරණ කාල සීමාව අවසන් වීමට පෙර, උප-අග්‍රිම ලේඛනයේ කිසියම් ශේෂයක් වේ නම් එය භාර දිය යුතු වුවද, 2020 දෙසැම්බර් 31 දිනට පාර්ශව හතරකට අවස්ථා 5කදී ලබා දුන් රු. 4,092,735 ක් 2020 දෙසැම්බර් 31 දිනට පියවා නොතිබුණි. | අනුකූලව කටයුතු කිරීමට පියවර ගනු ලැබේ.<br><br>නියමිත වේලාවට උප අග්‍රිම පියවීමට පියවර ගනු ලැබේ. | නිශ්චිත කාල සීමාවක් තුළ සියලුම උප අග්‍රිම භාර දිය යුතුය. |
| | -අවස්ථා 17 කදී ලබා දී ඇති රු. 965,150 තත්කාර්ය අත්තිකාරම් වලින් රු. 492,226 ක් ,එවැනි අත්තිකාරම් ගෙවීමට පෙර නිසි ඇස්තමේන්තු සකස් කර නොතිබීම හේතුවෙන් සියයට 22 සිට සියයට 100 දක්වා දින 07 සිට 196 දක්වා ප්‍රමාද වීමකින් පසුව මුදලින් පියවා ඇත. | නිසි ක්‍රියාකාරකම් මත පදනම් වූ පිරිවැය ඇස්තමේන්තු වලට අනුකූලව උප අග්‍රිමයන් වලින් මුදල් නිකුත් කිරීමට ක්‍රියා කරනු ඇත. | නිසි වියදම් ඇස්තමේන්තුවක් සකස් කිරීමෙන් පසු උප අග්‍රිමයන් ලබා දිය යුතුය. |
| (iii) මූල්‍ය රෙගුලාසි 756, 757, 758 සහ 759 | එක් එක් වාර්තාකරණ කාලසීමාව අවසානයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ජංගම නොවන වත්කම්වල භෞතික පැවැත්ම සහතික කිරීම සඳහා එක් එක් වාර්තාකරණ කාලසීමාවට අදාළ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදු කළ යුතු වුවද, අධිකාරියේ ප්‍රධාන කාර්යාලයට අයත් වත්කම් සම්බන්ධයෙන් මෙය 2021 නොවැම්බර් 30 දින වන විටද සිදු කර නොතිබුණි. | රට තුළ පවතින COVID-19 වසංගත තත්ත්වයන් හේතුවෙන් ජංගම නොවන වත්කම් පිළිබඳ ප්‍රධාන කාර්යාලයේ වාර්ෂික සමීක්ෂණය සිදු කිරීමට නොහැකි විය. එම කාර්යය කමිටුව විසින් අවසන් කර සත්‍යාපන වාර්තා වහාම ඉදිරිපත් කරනු ඇත. | මූල්‍ය ප්‍රකාශන සහ වත්කම් ලේඛනයේ දැක්වෙන ජංගම නොවන වත්කම්වල භෞතික පැවැත්ම සහතික කිරීම සඳහා වාර්ෂික සමීක්ෂණය සිදු කළ යුතුය. |
| (ඇ) 2015 ජුලි 10 දින අංක 02/2015 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය සහ 2018 ජුලි 16 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක | අධිකාරිය විසින් 2019 වර්ෂයේදී මූල්‍ය කල්බදු පදනම යටතේ මෝටර් රථ 3ක් මිලදී ගෙන ඇති අතර චක්‍රලේඛයේ විධිවිධාන අනුව අධිකාරියට අයත් වාහන තුනක් මේ සඳහා බැහැර කිරීමට නියමිත අතර ඒවා බැහැර කිරීමෙන් ලැබෙන මුදල් මහා භාණ්ඩාගාරයට ගෙවීමට නියමිතය. කෙසේ වෙතත්, බැහැර කිරීමට යෝජිත එක් වාහනයක් | වාහන තක්සේරු කමිටුවක් පත් කර අදාළ තක්සේරු වාර්තාව ලබා ගන්නා ලදී. ඒ අනුව එම මුදල් භාණ්ඩාගාරයට යැවීමට සියලු කටයුතු සූදානම් කර ඇත. | නව වාහන මිලදී ගැනීමේදී පවතින වාහන ඉවත් කළ යුතු අතර පැරණි වාහන ඉවත් කිරීමෙන් ලැබෙන ආදායම නව වාහන මිලදී ගැනීමෙන් පසු |

| | | | |
|---|---|---|---|
| 03/2018 හි 06 වැනි ඡේදය. | එලෙස බැහැර නොකොට 2021 ඔක්තෝම්බර් මස දක්වා අධිකාරියේ පරිශ්‍රයේ තබා තිබුණි. ඊට අමතරව ඉතිරි වාහන දෙක ඉවත් කිරීමෙන් ලැබුණු රු. 5,773,000 ක මුදල වසර දෙකකට වැඩි කාලයක් ගෙවී ගියද භාණ්ඩාගාරයට ප්‍රේෂණය නොකර අධිකාරිය විසින් රඳවා ගෙන තිබුණි. | | මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතුය. |
| (ඇ) 2020 ජනවාරි 27 දිනැති අංක PED/01/2020 මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ චක්‍රලේඛයේ 06 ඡේදය | පුරවැසි ප්‍රඥප්ති, ගාස්තු ඇතුළු එක් එක් සේවාව සඳහා ඇස්තමේන්තුගත කාල සීමාවන් යනාදිය කාර්යාල පරිශ්‍රවල සහ වෙබ් අඩවිවල මහජනතාවට / පාරිභෝගිකයින්ට ප්‍රදර්ශනය කිරීමට සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩලය වග බලා ගත යුතුය. කෙසේ වෙතත්, අධිකාරිය මෙම උපදෙස්වලට අවනත වී නොමැත. | පුරවැසි ප්‍රඥප්තිය අධිකාරිය විසින් කෙටුම්පත් කර ඇති අතර එය නුදුරු අනාගතයේ දී අවසන් කර ආයතනයේ වෙබ් අඩවියේ මහජන නැරඹීමට සහ ප්‍රදර්ශනය කිරීමට හැකි වනු ඇත. | අධිකාරියේ මහජන වගවීම සහ පාලනය වැඩිදියුණු කිරීම සඳහා පුරවැසි ප්‍රඥප්ති සකස් කර ප්‍රදර්ශනය කළ යුතුය. |
| (ඉ) යහපාලනය සඳහා වූ පොදු ව්‍යවසාය මාර්ගෝපදේශ පිළිබඳ 2003 ජූනි 02 දින PED/12 දරන පොදු ව්‍යවසාය චක්‍රලේඛයේ 4.2.5 ඡේදය. | අධ්‍යක්ෂක මණ්ඩල මාසික රැස්වීම් වල සමාලෝචනය සහ සාකච්ඡා සඳහා තොග කාල විශ්ලේෂණ වාර්තාවක් ඉදිරිපත් කල යුතු වුවද, ගිණුම්කරණ පද්ධතිය තුළින් තොග කාල විශ්ලේෂණ වාර්තාවක් ලබා ගැනීමේ හැකියාවක් අධිකාරියට නොමැත. එබැවින්, තොග කාල විශ්ලේෂණය මත පදනම්ව සෙමින් චලනය වන, චලනය නොවන සහ යල් පැන ගිය අයිතම හඳුනාගැනීමේ දී අධිකාරිය දුෂ්කරතාවන්ට මුහුණ දෙමින් සිටී. | පද්ධතිය වැඩිදියුණු කිරීමට සහ තොග කාල විශ්ලේෂණ වාර්තාවක් ලබා ගැනීමට අපි පද්ධති සංවර්ධකයා සමඟ සාකච්ඡා කරන්නෙමු. තවද, තොග සත්‍යාපනය කිරීමේ ක්‍රියාවලියේදී සෙමින් චලනය වන, චලනය නොවන සහ යල් පැන ගිය අයිතම හඳුනාගනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට පෙර තොග කාල විශ්ලේෂණ මත පදනම්ව සෙමින් චලනය වන, චලනය නොවන සහ යල් පැන ගිය අයිතම හඳුනාගත යුතුය. |
| (ඊ) 2015 මැයි 25 දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක PED/01/2015. | නිලධාරීන් 05 දෙනෙකු අනුමත මාසික ඉන්ධන සීමාවන් ඉක්මවා යාමින් ලබා ගන්නා ලද රු. 621,076 ක් වටිනා ඉන්ධන ලීටර් 4,436 ක් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. . | කොරෝනා වසංගතය හේතුවෙන් අන්තර් පළාත් ගමනාගමන සීමාවන් ක්‍රියාත්මක විය. ඒ නිසා මෙහි සඳහන් නිලධාරීන්ගේ වාහන පොදු ප්‍රවාහනය සඳහා ද භාවිත කිරීමට සිදු විය. ඒ අනුව එම රාජකාරී | අධිකාරිය චක්‍රලේඛයේ ප්‍රතිපාදනයන්ට අනුකූලව කටයුතු කළ යුතුය. |

සඳහා ද ඉන්ධන ප්‍රමාණයක් භාවිතා කර ඇත.

## 1.8 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ගල්කුලම ක්‍රියාකරු අභ්‍යාස විද්‍යාලයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා 2018 සිට 2020 දක්වා කාලය තුළ රු. මිලියන 135 ක මුදලක් මහා භාණ්ඩාගාරයෙන් ලබාගෙන තිබුණි. එයින් රු. මිලියන 34.6 ක මුදලක් එනම් සියයට 26 ක් අපේක්ෂිත කාර්යය සඳහා යොදා නොගෙන අධිකාරියේ බැංකු ජංගම ගිණුමේ නිෂ්ක්‍රීයව තබා තිබුණි. | 2020 දී ලැබුණු අරමුදල් ප්‍රතිපාදන බැකෝ ලෝඩර් ප්‍රසම්පාදනයේ ප්‍රමුඛතා අපේක්ෂිත කාර්යය සඳහා ප්‍රමාණවත් නොවූ අතර ටෙන්ඩර් ඇගයුම් අදියර දක්වා අවසන් කර තිබූ ප්‍රසම්පාදනය සඳහා ප්‍රමාණවත් ලෙස අරමුදල් ප්‍රතිපාදනය වැඩි කිරීමට උත්සාහයන් කිහිපයක්ම ගෙන තිබුණි. වසර පුරා එම කාර්යය සඳහා ප්‍රමාණවත් මුදල් ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් එම ප්‍රතිපාදන යෝජනාවේ අනෙකුත් කාර්යයන් සඳහා යෙදවීමට කටයුතු යොදා ඇත. | බැංකුවේ ජංගම ගිණුම්වල නිෂ්ක්‍රීයව තබා නොගෙන එම අරමුදල අපේක්ෂිත කාර්යය සඳහා යෙදවීමට ඵලදායී ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) 2018,2019,2020 වර්ෂවලදී අධිකාරියේ ප්‍රධාන කාර්යාලය මගින් පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමක දළ වශයෙන් රු. මිලියන 202, 260ක් සහ රු. මිලියන 357 ක පමණ සාමාන්‍ය ශේෂයක් රඳවාගෙන තිබූ අතර, මෙම ශේෂය අඛණ්ඩව 2021 ඔක්තෝම්බර් 31 දිනට රු. මිලියන 426 ක් දක්වා කිසිදු කටයුත්තක් සඳහා යොදා නොගැනීමෙන් ඉහළ ගොස් ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස 2018 ජනවාරි සිට 2021 ඔක්තෝම්බර් දක්වා කාලය තුළ ඉහත මුදල් බැංකු ජංගම ගිණුමක නිෂ්ක්‍රීයව තැබීමෙන් අධිකාරියට දළ වශයෙන් රු. 98ක මූල්‍ය පාඩුවක් සිදුවී ඇත. | රු. මිලියන 426 ක බැංකු ශේෂයෙන් රුපියල් මිලියන 200 ක් ව්‍යාපෘති සහ වැඩසටහන් සඳහා භාණ්ඩාගාරයෙන් ලැබුණු අග්‍රිමයෙන් සමන්විත වේ. ඉතිරි මුදල් අපේක්ෂිත කාර්යය සඳහා යෙදවීමට කටයුතු කරනු ලැබේ. | බැංකුවේ ජංගම ගිණුම්වල නිෂ්ක්‍රීයව තබා නොගෙන එම අරමුදල අපේක්ෂිත කාර්යය සඳහා යෙදවීමට ඵලදායී ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

--------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 25,998,627 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 4, 652,776 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 30,651,403 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට හේතු වූයේ අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලද රුපියල් 45,844,000ක මුළු මුදල සමාලෝචිත වර්ෂය සඳහා ආදායමක් ලෙස හඳුනා ගැනීමයි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------

### 3.1 අනාර්ථික ගනුදෙනු

--------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඉදිකිරීම් ක්ෂේත්‍රයේ යෙදී සිටින දක්ෂ ශිල්පීන් සඳහා ශිල්ප හැඳුනුම්පත ලබාදීම සඳහා 2019 සහ 2020 වසර තුළ මහා භාණ්ඩාගාරයෙන් රු. මිලියන 35.7ක මුදලක් ලැබී ඇත. ඉන් රු. මිලියන 11.3ක් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2019 වසරේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනයට (ICTA) අත්තිකාරම් වශයෙන් ලබා දී තිබුණි. මෙම කාර්යය 2020 වර්ෂය තුළ අවසන් කළ යුතු වුවද 2021 නොවැම්බර් මාසය අවසන් වනතුරුත් එය අවසන් කර නොතිබුණි.<br>තවද, රු. මිලියන 11.3 ක අත්තිකාරම් මුදල වසර දෙකකට වැඩි කාලයක් ICTA ආයතනයෙන් රඳවා ගෙන තිබූ අතර, සිදුවූ මූල්‍ය පාඩුව ගණනය කර වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් ආයතනය දැනුවත් කර ඇති අතර අදාළ බිල්පත් සම්බන්ධ මුදල් ආපසු ගෙවීමට ඔවුන් සූදානමින් සිටී. ඒ සඳහා වැඩකටයුතු දැනට කරගෙන යමින් පවතී. | අධිකාරියට ලැබිය යුතු ඉතිරි මුදල් අයකර ගැනීමටත් අධිකාරියට සිදු වූ පාඩුව වගකිවයුතු පුද්ගලයන්ගෙන් අයකර ගැනීමටත් වහා පියවර ගත යුතුය. |

### 3.2 හඳුනාගත් පාඩු

---------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2006 ජනවාරි 1 සිට 2011 මැයි 31 දක්වා කාලයට අදාළව රු. 14,977,525 ක සේවක අර්ථසාධක අරමුදල් නොගෙවීම හේතුවෙන් සේවක අර්ථසාධක අරමුදල (EPF) විසින් රු. 5,691,460 ක අධිභාරයක් පනවා තිබුණි. කෙසේ වෙතත් 2021 නොවැම්බර් 30 දින වන විටද මෙම | හිඟ මුදල් අධිභාරය සමඟ ගෙවීමට පියවර ගනු ලැබේ. | තවදුරටත් අධිභාර පැනවීම වළක්වා ගැනීම සඳහා වහාම ගෙවීම් කළ යුතුය. |

ගෙවිය යුතු මුදල ප්‍රේෂණය කර නොතාබුණි.

## 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අධිකාරිය පිහිටුවා වසර හයකට වඩා වැඩි කාලයක් ගතවී ඇතත්, අධිකාරියේ ඵලදායී හා සුමට මෙහෙයුම් සඳහා 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ දක්වා ඇති පහත සඳහන් ක්‍රියාකාරකම් අධිකාරිය විසින් සිදු කර නොතිබුණි.<br><br>• ඉදිකිරීම් කර්මාන්තය සඳහා යොදා ගනු ලබන ඉදිකිරීම් ද්‍රව්‍ය සහ ඉදිකිරීම් උපාංග ආනයනකරුවන්, නිෂ්පාදකයන් සහ සැපයුම්කරුවන්ගේ නාමාවලියක්, මේ පනත යටතේ සාදනු ලබන රීති මගින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයට පවත්වාගෙන යෑම.<br><br>• මේ පනත යටතේ සාදනු ලබන රීති මගින් නිශ්චය කරනු ලැබිය හැකි ඉදිකිරීම් ශිල්පයන්හි නිපුණ ශ්‍රමිකයන් ලියාපදිංචි කිරීමට සහ ඔවුන්ට ශිල්පීය හැඳුනුම්පත් නිකුත් කිරීමට විධිවිධාන සැලසීම.<br><br>• ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අරමුදල පිහිටුවීම.<br><br>• වෙනත් රටවල ඉදිකිරීම් කටයුතු භාරගනු ලබන දේශීය වශයෙන් ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් ප්‍රවර්ධනය කිරීම සහ සුභසාධනය.<br><br>• ඉදිකිරීම් කර්මාන්තයේ යම් ද්‍රව්‍ය,පිරියත සහ යන්ත්‍රෝපකරණ අවශ්‍යතා සමාලෝචනය සහ අධීක්ෂණය කිරීම සහ ඉදිකිරීම් වැඩ වලදී දේශීය නිෂ්පාදන සංවර්ධනය කිරීම හා භාවිතයට ගැනීම දිරිමත් කිරීම.<br><br>• ඉදිකිරීම් කර්මාන්තය සම්බන්ධ ජාතික දත්ත සැකසුමක් පවත්වාගෙන යෑම. | සටහන් කර ගන්නා ලදී. | ඉදිකිරීම් කර්මාන්තයෙන් රටට ලැබෙන දායකත්වය නඟා සිටුවීමට හා වැඩි කිරීමට අධිකාරිය මෙම කටයුතු කඩිනම් කළ යුතුය. |

## 3.4 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මහා භාණ්ඩාගාරය විසින් 2016 සිට 2020 දක්වා කාලය තුළ රු. මිලියන 1,077 ක මුදලක් රේඛීය අමාත්‍යාංශය හරහා ඉදිකිරීම් කර්මාන්තය සඳහා වන නිපුණතා පුහුණුව PPP ආකෘතියෙන් ක්‍රියාත්මක කිරීම සඳහා අධිකාරිය වෙත නිකුත් කර ඇත. එයින් රු. මිලියන 114.2 ක් අපේක්ෂිත කාර්යය සඳහා භාවිතා නොකර 2021 ඔක්තෝබර් 31 දින වන විටද බැංකු ජංගම ගිණුමක් තුළ රඳවා ගෙන තිබුණි. | භාණ්ඩාගාර අග්‍රිම ශේෂය අපේක්ෂිත කාර්යය සඳහා යොදා ගැනීමට පියවර ගත යුතුය. | බැංකුවේ ජංගම ගිණුම්වල නිෂ්ක්‍රීයව තබා නොගෙන එම අරමුදල අපේක්ෂිත කාර්යය සඳහා යෙදවීමට ඵලදායී ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.5 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අධිකාරිය 2018 නොවැම්බර් 7 වන දින රු.17,296,564 ක කොන්ත්‍රාත් මුදලකට ගල්කුලම ප්‍රදේශයේ සංචාරක බංගලාවක් ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරුවෙකු සමඟ කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ ඇත. කොන්ත්‍රාත් ගිවිසුමේ සාමාන්‍ය කොන්දේසි අනුව මෙම බංගලාව කොන්ත්‍රාත් ගිවිසුමේ දින සිට දින 210 ක් ඇතුළත සම්පූර්ණ කළ යුතුය. කෙසේ වෙතත්, සංචාරක බංගලාව සම්පූර්ණ කර අධිකාරියට භාර දෙනු ලැබුවේ 2020 ජුනි 18 දින දී ය. නමුත් ප්‍රමාද ගාස්තු අයකර ගැනීම සම්බන්ධයෙන් කොන්ත්‍රාත් ගිවිසුමේ ප්‍රතිපාදන ඇතුළත් කර නොමැති බැවින් ප්‍රමාද වූ කාලසීමාවේදී කිසිදු ප්‍රමාද ගාස්තුවක් ඉල්ලා සිටීමට අධිකාරියට නොහැකි විය. | උපදේශකවරයාගේ නිර්දේශවලට සහාය දක්වමින් කොන්ත්‍රාත්කරු විසින් කරන ලද ඉල්ලීම් සලකා බලමින් අධිකාරිය විසින් කාලය දීර්ඝ කිරීම් 3ක් ලබා දී ඇත. අනුමත කාලය දීර්ඝ කිරීම ප්‍රමාද නොකර කොන්ත්‍රාත්කරු විසින් ව්‍යාපෘතිය නිම කර ඇත. කෙසේ වෙතත්, එය හැකි ඉක්මන් දිනය ලෙස 2020 ජුනි 18 වන විට ව්‍යාපෘතිය භාර දී ඇත. එබැවින්, මෙම ව්‍යාපෘතිය ප්‍රමාද ගාස්තු ඉල්ලා සිටීම සඳහා සලකා බැලිය නොහැක. | ප්‍රමාදයන් අවම කර ගැනීමටත් ජාතියට වඩාත් වාසිදායක සේවාවන් මූල්‍යමය වශයෙන් ලබා ගැනීමටත් රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුගත වීමට අධිකාරිය කටයුතු කළ යුතුය. |

## 3.6 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විගණනය සඳහා සපයා ඇති තොරතුරුවලට අනුව, රු. 103,263,865ක් වටිනා පුහුණු මෙවලම් කට්ටල, රු. 10,054,498ක් වටිනා පුහුණු ද්‍රව්‍ය (පුහුණුකරුවන් සහ අභ්‍යාසලාභීන්ගේ මාර්ගෝපදේශ හා වාර්තා පොත්) සහ රු. 50,146,836ක් වටිනා නිල ඇඳුම් 2016 සිට 2020 දක්වා කාලය තුළ පවත්වන ලද ඉදිකිරීම් කර්මාන්ත සඳහා වූ කුසලතා පුහුණු වැඩසටහන යටතේ මිල දී ගෙන ඇත. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල ඇති මාර්ගෝපදේශ හා ප්‍රසම්පාදන නීතීන් උල්ලංඝනය කිරීම සහ ගුණාත්මකභාවයෙන් අඩු භාණ්ඩ ප්‍රසම්පාදනය කිරීම ආදිය හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට අධිකාරියට රුපියල් මිලියන 52.25 ක අලාභයක් සිදුවී ඇත. | පුහුණු කට්ටල ලබා ගැනීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවේ සේවය කළ නිලධාරීන් ලබාදුන් මිල ගණන් සසඳා නියැදි පරීක්ෂා කර ඇත. මෙම නියැදි පරීක්ෂා කිරීමේ කමිටුවේ සභාපතිවරයා ලෙස මේ සම්බන්ධයෙන් විශේෂ දැනුමක් ඇති විශේෂඥ ඉංජිනේරුවරයෙකු ද පත්කර ඇත. ඒ අනුව අඩුම මිලට සහ දෙවන මිලට ප්‍රමුඛත්වය ලබාදී රජය සතු සමාගමක් වන ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවෙන් උපකරණ කට්ටල ලබා ගැනීමට නිර්දේශ කර ඇත.<br>තවද, නියැදි තෝරාගත් සැපයුම්කරුවන්ගෙන් ලබාගෙන, හැකි අඩුම මිලට ඉතා හොඳ තත්ත්වයේ කට්ටලයක් සැපයීමට අවශ්‍ය බැවින් අදාළ සැපයුම්කරුවන්ගෙන් තෝරා ගන්නා ලදී. | ජාතිය සඳහා මූල්‍යමය වශයෙන් වඩාත්ම වාසිදායක සහ ගුණාත්මකව හොඳම සැපයුම් ලබා ගැනීම සඳහා රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුකූලව කටයුතු කිරීමට අධිකාරිය කටයුතු කළ යුතුය. |

## 3.7 වෙනත් සංවිධානවලට මුදාහළ සම්පත්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2003 ජූනි 02 වැනි දින යහපාලනය සඳහා වූ රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛයේ අංක .PED/12 හි 9.4 වගන්තියේ විධිවිධානවලට පටහැනිව අධිකාරියේ සේවකයකු 2015 පෙබරවාරි 09 දින සිට ක්‍රියාත්මක වන පරිදි රේඛීය අමාත්‍යාංශයට නිදහස් කර / අනුයුක්ත කර ඇත. වැටුප් සහ අනෙකුත් දීමනා දළ වශයෙන් රු. 4,687,732 ක් 2015 පෙබරවාරි 09 සිට 2020 දෙසැම්බර් 31 දක්වා කාලය සඳහා මෙම නිලධාරියාට ගෙවා ඇති අතර, 2021 ඔක්තෝබර් 31 වන විටද රේඛීය | අදහස් දැක්වීමක් නොමැත. | රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව අධිකාරියේ සේවකයින් රේඛීය අමාත්‍යාංශයට නිදහස් කිරීම / අනුයුක්ත නොකළ යුතුය. |

අමාත්‍යාංශයෙන් කිසිදු අරමුදලක් ප්‍රතිපූර්ණය කර නොතිබුණි.

**3.8 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක PED/12 හි 9.14 ඡේදයට අනුව, අධිකාරියේ මානව සම්පත් සුමට හා ඵලදායී පරිපාලනය සඳහා මානව සම්පත් කළමනාකරණයට අදාළ සියලු කරුණු සම්බන්ධයෙන් නීති රීති සපයන ක්‍රියා පටිපාටි අත්පොතක් අධිකාරිය සතුව නොතිබුණි. | අධිකාරියේ මානව සම්පත් සහ පරිපාලන ක්‍රියා පටිපාටි අත්පොත 2019 ජනවාරි 30 දින පැවති අංක 01/2019 BOM රැස්වීමෙන් අනුමත කර ඇත. | මානව සම්පත් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා අධිකාරිය සතුව ක්‍රියා පටිපාටි අත්පොතක් තිබිය යුතුය. |

**3.9 වාහන පද්ධතිය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) විගණනය සඳහා සපයා ඇති තොරතුරුවලට අනුව සමාලෝචිත වර්ෂය තුළ වාහන 8ක් අවස්ථා 10කදී අනතුරුවලට ලක්ව ඇති අතර වාහන අනතුරු 6කට අදාළ රක්ෂණ හිමිකම් පමණක් අදාළ රක්ෂණ සමාගමෙන් ඉල්ලා ඇත. කෙසේ වෙතත්, අනෙකුත් වාහන අනතුරු සඳහා වන අලාභය සහ වාහන අනතුරු සම්බන්ධයෙන් වන මූලික වාර්තා සහ අවසන් වාර්තා විගණනය සඳහා ලබා දී නොතිබුණි. | වාහන හතරෙන් දෙකක් අලුත්වැඩියා කර අවසන් කර ඇත. අනෙක් වාහන දෙක ද ඉතා ඉක්මනින් අළුත්වැඩියා කරනු ලැබේ. | සිදුවූ අලාභය සොයා බැලීම සඳහා වාහන අනතුරු සම්බන්ධයෙන් මූලික වාර්තා සහ අවසන් වාර්තා විගණනය සඳහා ලබා දිය යුතුය. |
| (ආ) රු. 6,981,250ක පිරිවැය වූ අධිකාරියේ වාහන 6ක් (එක් වාහනයක් හැර) වසර 2 සිට 5 දක්වා කාලය තුළ අධිකාරියට අයත් CETRAC පරිශ්‍රයේ ප්‍රයෝජනයට නොගෙන, අළුත්වැඩියා කිරීමෙන් හෝ බැහැර කිරීමෙන් තොරව දිරාපත් වීමට ඉඩ ලබා දී ඇත. | වාහන හතරක් බැහැර කිරීමට කමිටුවක් පත් කර ඇති අතර තවත් වාහන දෙකක් භාවිතය සඳහා අලුත්වැඩියා කරමින් පවතී. | පොදු දේපළවල ආරක්ෂාව වැඩි කිරීම සඳහා භාවිතයට නොගත් වාහන බැහැර කිරීමට කාලෝචිත ක්‍රියාමාර්ග අවශ්‍ය වේ. |
| (ඇ) 2016 දෙසැම්බර් 29 දින අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 03 වැනි වගන්තියට අනුව සෑම ඉන්ධන පරීක්ෂණයකින්ම මාස 12ක කාලයකට පසුව හෝ කිලෝමීටර 25,000ක දුරක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමේ විශාල | වාහනවල ඉන්ධන පරිභෝජනය 2020 වර්ෂයේදී පරීක්ෂා කරන ලද අතර එය 30/2016 PA චක්‍රලේඛය අනුව නැවත පරීක්ෂා කෙරේ. | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල වීමට පියවර ගත යුතුය. |

අලුත්වැඩියාවක් සිදු කිරීමෙන් පසු යන සිද්ධීන් වලින් ප්‍රථමයෙන් සිදුවන සිද්ධියකදී ඉන්ධන පරිභෝජනය නැවත පරීක්‍ෂා කළ යුතුය. කෙසේ වෙතත්, අධිකාරියට අයත් වාහන 50ක් සම්බන්ධයෙන් එවැනි ඉන්ධන පරීක්ෂණ වාර්තා විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2019 වර්ෂය සඳහා වූ අධිකාරියේ වාර්ෂික වාර්තාව මෙම වාර්තාව නිකුත් කරන දිනය වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | කැබිනට් අනුමැතිය ලබා ගැනීම සඳහා භාෂා 03කින් යුත් වාර්ෂික වාර්තාවේ අවසන් පිටපත 2021.08.04 දින නිවාස හා ඉදිකිරීම් සහ ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී. | එම වාර්තා තවදුරටත් ප්‍රමාදයකින් තොරව පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කඩිනම් කළ යුතුය. |